---

**බඩල්කුඹුර ප්‍රාදේශීය සභාව**

**මොණරාගල දිස්ත්‍රික්කය**

---

1. **මූල්‍ය ප්‍රකාශන**

**1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

සමාලෝචිත වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන 2013 මැයි 17 වැනි දිනද , ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2012 අගෝස්තු 09 වැනි දින ද විගණනයට ඉදිරිපත් කර තිබු අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපති වාර්තාව 2013 සැප්තැම්බර් 20 දින සභාවේ සභාපතිවරයා වෙත යවන ලදී.

**1.2 මතය**

මාගේ වාර්තාවේ දක්වා ඇති අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් හේතුකොට ගෙන විගණනය සඳහා ඉදිරිපත් කර ඇති බඩල්කුඹුර ප්‍රාදේශීය සභාවේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වු මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මම මතයක් ප්‍රකාශ නොකරමි.

**1.3 මූල්‍ය ප්‍රකශන පිළිබඳ අදහස් දැක්වීම**

**1.3.1 ගිණුම්කරණ අඩුපාඩු**

(අ) සභාවේ ඉඩම් හා ගොඩනැගිලි වල වටිනාකම් තක්සේරු කර ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) වර්ෂය අවසානයට වෙළඳ බලපත්‍ර ගාස්තු හිඟ ආදායම රු.84,540 ක් ගිණුම් ගත කර නොතිබුණි

**1.3.2 විගණනය සඳහා සාක්ෂි නොවීම**

අවශ්‍ය තොරතුරු ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.21,319,967 ක වත්කම්ද රු.10,689,976ක් වටිනා වගකීම් හා රු.41,675 ක ගණුදෙණුද විගණනයේදී සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට නොහැකි විය.

## 2. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේආදායමඉක්ම වූ පුනරාවර්තන වියදම රු.719,031 ක් වූ අතර ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.205,969 ක් විය.

### 2.2 අයවැය පාලනය

සමාලෝචිත වර්ෂය වෙනුවෙන් සභාව විසින් පිළියෙල කරන ලද අයවැය ලේඛනය සහ තථ්‍ය ආදායම් හා වියදම් අතර අය ශීර්ෂ තුනක සහ වැය ශීර්ෂ තුනක සියයට 19 සිට සියයට 90 දක්වා විචලනයන් පැවති හෙයින් අයවැය ලේඛනය ඵලදායි පාලන කාරකයක් ලෙස යොදා ගෙන නොතිබුණි.

### 2.3 ආදායම් පරිපාලනය

#### 2.3.1 ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම් ,තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|---|
| | | රු.000' | රු.000' | රු.000' |
| (i) | වරිපනම් හා බදු | 611 | 66 | 308 |
| (ii) | බදු කුලී | 3,200 | 83 | 17 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 1,607 | 540 | 84 |
| (iv) | වෙනත් ආදායම් | 186 | - | 1 |

### 2.3.2 වරිපනම් බදු

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 140(1) ප්‍රකාර 2006 න් පසු මේ දක්වා වරිපනම් බදු තක්සේරු කර නොතිබුණි.

### 2.3.3 බදු කුලී

(අ) බඩල්කුඹුර අංක 04 එළහරක් මස් කඩය විධිමත් ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුගමනය නොකර සහ සභාවේ අනුමැතියක් ලබා නොගෙන 2011 වර්ෂයේදී රු.1,360,500 කට බදුගෙන තිබූ බදුකරුට සමාලෝචිත වර්ෂය සඳහා ප්‍රසම්පාදන ක්‍රියාවලියකින් තොරව ශීතකල එළහරක් මස් වෙළඳසැලක් පවත්වාගෙන යාම සඳහා රු.3,300 ක වෙළඳ බලපත්‍රයක් නිකුත් කර තිබුණි.

(ආ) ප්‍රාදේශීය සංවර්ධන අමාත්‍යාංශයේ ප්‍රතිපාදන මත 2008 වර්ෂයේදී ඉදිකරන ලද බඩල්කුඹුර වෙළඳ සංකීර්ණයේ කඩකාමර 16 ක් 2012 දෙසැම්බර් 31 දක්වාම බදු දීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) බඩල්කුඹුර සතිපොල අංක 08 කඩ කාමරය සමාලෝචිත වර්ෂය සඳහා රජයේ ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුගමනය නොකර බදු දී තිබුණි.

### 2.3.4 උසාවි දඩ හා මුද්දර ගාස්තු

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2012 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ උසාවි දඩ හා මුද්දර ගාස්තුගණනය කර නොතිබුණි.

### 2.3.5 නිශ්ක්‍රීය භෞතික සම්පත්

සමාලෝචිත වර්ෂය අවසානය වන විට වාහන හා යන්ත්‍ර සූත්‍ර 11 ක් නිෂ්ක්‍රීයව පැවතුණි.

## 2.4 ප්‍රමාණවත් අධිකාරී බලයකින් තහවුරු නොවූ ගනුදෙනු

2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 1.2.2 (අ) වගන්තිය ප්‍රකාර ප්‍රසම්පාදන ක්‍රියාමාර්ග අනුගමනය නොකර අවස්ථා 04 කදී ජල උපකරණ මිලදී ගැනීමට හා වෙනත් සේවාවන් සඳහා රු.71,180 ක් වැයකර තිබුණි.

## 2.5 අවිධිමත් ගණුදෙනු

ආයතන සංග්‍රහයේ VII වන පරිච්ඡේදයේ 12 වන උප වගන්තිය ප්‍රකාරව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ විධිමත් පත්වීමක් නොමැතිව ලේකම් තනතුරේ වැඩ බැලීම වෙනුවෙන් සභා ලේකම්වරයාට 2012 ජනවාරි 14 සිට 2012 සැප්තැම්බර් දක්වා රු.45,889 ක වැඩ බැලීමේ දීමනා ගෙවා තිබුණි.

## 2.6 මෙහෙයුම් අකාර්යක්ෂමතා

**පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.**

(අ) 1987 අංක 15 දරන ප්‍රාදේශිය සභා පනතේ 158 හා 159 වගන්ති ප්‍රකාරව සමාලෝචිත වර්ෂය අවසානයට එකතුව රු.1,012,292 ක් හිඟ ආදායම් අයකරගෙන නොතිබුණි.

(ආ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172(2) වගන්තිය ප්‍රකාරව සමාලෝචිත වර්ෂය අවසාන වන විට 1990 සිට 2008 වර්ෂ දක්වා වූ කාලපරිච්ඡේදය වෙනුවෙන් විගණන ගාස්තු රු.256,050 ක් ගෙවීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) වර්ෂ ගණනාවකට පෙර අලුත්වැඩියාව සඳහා පෞද්ගලික ගරාජයකට රැගෙන ගොස් තිබුණ සභාව සතුව තිබූ ජලබවුසරය අලුත්වැඩියාවෙන් පසු 2012 දෙසැම්බර් 31 දක්වා සභාවට ගෙනවිත් භාරදී නොතිබූ අතර අලුත්වැඩියා කළ බවට කිසිදු සාක්ෂියක් විගණනයට ඉදිරිපත් නොවීය.

(ඈ) විවිධ මිලදී ගැනීම් සඳහා අවස්ථා 14 ක දී රු.66,995 ක් සඳහා මුදල් රෙගුලාසි 237(ආ) ප්‍රකාරව තොග සහතික ලබාගෙන නොතිබුණි.

## 2.7 ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය

ඝණ අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය බිම් කොටස් 2010 දෙසැම්බර් 14 වන දින දිස්ත්‍රික් ඉඩම් ප්‍රතිසංස්කරණ බල මණ්ඩලය විසින් ලබා දී තිබුණි. කොම්පෝස්ට් ව්‍යාපෘතිය සඳහා 2009 අගෝස්තු 28 වන දින මධ්‍යම පරිසර අධිකාරියෙන් පරිසර වාර්තාවක් ලබා ගැනීම සඳහා රු.11,312 ක් ගෙවා තිබුණ ද සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් කසල බැහැර කිරීම අවිධිමත් ආකාරයට සිදුකර තිබූ අතර කොම්පෝස්ට් ව්‍යාපෘතියද ආරම්භ කර නොතිබුණි.

## 03. පද්ධති හා පාලන

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය

(ආ) අභ්‍යන්තර පාලනය

(ඇ) ආදායම් පරිපාලනය